**විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා සහාය වීමේ ව්‍යාපෘතිය - 2020**
-----------------------------------------------------------------------------------------------------------

**විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා සහාය වීමේ ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 දෙසැම්බර් 19 දින එළඹි අංක 0486-එස්ආර්අයි දරන ප්‍රදාන ගිවිසුමේ II වගන්තියේ 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.**

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**
-------------------------------------------------------------------------------------

**ව්‍යාපෘතියේ ප්‍රදාන ගිවිසුමට අනුව, විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. බස්නාහිර පළාතේ පුනර්ජනනීය බලශක්ති ක්ෂුද්‍ර බෙදා හැරීමේ පද්ධතියක් ඉදි කිරීම මඟින් දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධති ස්ථාපනය කිරීමට සහය ලබා දීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. පුනර්ජනනීය බලශක්ති ක්ෂුද්‍ර බෙදා හැරීමේ පද්ධතියක් ස්ථාපනය කිරීම නම් වූ සංරචකය යටතේ ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කෙරේ. ප්‍රදාන ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 268.36 කට සමාන වූ එ.ජ.ඩො මිලියන 1.8 ක් වන අතර එම මුළු මුදලම ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය මඟින් එහි කටයුතු 2017 ජූනි 29 දින ආරම්භ කර ඇති අතර 2021 සැප්තැම්බර් 30 දින වන විට එම කටයුතු අවසන් කිරීමට සැලසුම් කර ඇත.**

**1.3 මතය**
-------

**2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර් ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.4 මතය සඳහා පදනම**
----------------------

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**
------------------------------------------------------------------------------------------------

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**
**ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.**

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක
  සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික හා මූල්‍ය ප්‍රගතිය

| | | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | වැඩ සහ උපදේශන සේවා | මුළු ප්‍රදාන මුදලින් එ.ජ.ඩො මිලියන 1.5 ක් හා එ.ජ.ඩො මිලියන 0.3 ක් පිළිවෙලින් වැඩ සංරචකය සහ උපදේශන සේවා සඳහා වෙන් කර තිබුණි. ප්‍රදාන ගිවිසුමට අනුව ප්‍රදානය අවසන් වන දිනය 2022 මාර්තු 31 වුවත්, 2020 දෙසැම්බර් 31 දිනට වැඩ සංරචකය සඳහා එ.ජ.ඩො මිලියන 0.159 ක් හෝ සියයට 11 ක් සහ උපදේශන සේවා සඳහා එ.ජ.ඩො මිලියන 0.109 ක් හෝ සියයට 37 ක් පමණක් උපයෝජනය කර තිබුණි. | 2021 පෙබරවාරි 10 දින ආසියානු සංවර්ධන බැංකුවේ එකඟතා ලිපිය ලැබීමත් සමඟ ණයවර ලිපිය ක්‍රියාත්මක තත්වයට පත් වීමෙන් පසුව පමණක් ඉදිකිරීම් වැඩ සඳහා ප්‍රදානය ප්‍රතිලබ්ධිවීම ආරම්භ විය. | ව්‍යාපෘතිය සැලසුම් කල කාලය තුළ සම්පූර්ණ කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාකාරකම් වේගවත් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ආ) | ක්ෂුද්‍ර බෙදා හැරීමේ පද්ධතිය හා පර්යේෂණ හා සංවර්ධන විද්‍යාගාරය ස්ථාපනය කිරීම | පුනර්ජනනීය බලශක්ති ක්ෂුද්‍ර බෙදාහැරීමේ පද්ධතිය නිර්මාණය කිරීම, සැපයීම සහ ස්ථාපනය කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව 2020 පෙබරවාරි 11 දින පිරිනමා තිබූ අතර කොන්ත්‍රාත් ගිවිසුම 2020 ජූලි 03 දින අත්සන් කර තිබුණි. ව්‍යාපෘති ලේඛනය අනුව 2021 නොවැම්බර් 30 දින වන විට ක්ෂුද්‍ර බෙදා හැරීම් පද්ධතිය ස්ථාපනය සම්බන්ධ ක්‍රියාකාරකම් අවසන් කිරීමට කොන්ත්‍රාත්කරු එකඟ වී තිබුණි. කෙසේ වුවද, සුදුසු ඩීසී කේබල් (DC Cable) මාර්ග හඳුනා ගැනීම, බැටරි බහාලුම සහ ඩීසල් ජෙනරේටරය සවි කිරීම සඳහා සුදුසු ස්ථාන හඳුනා ගැනීම වැනි මූලික ක්‍රියාකාරකම් පමණක් අවසන් කර තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීම | කොන්ත්‍රාත් ගිවිසුම අනුව සේවා සම්බන්ධව අපේක්ෂිත නිම කිරීමේ දිනය ගණනය කල යුත්තේ ක්‍රියාත්මක දිනයට කොන්ත්‍රාත්තුවේ සඳහන් කාලය එකතු කිරීම වශයෙනි. ණයවර ලිපිය කොන්ත්‍රාත්කරුට නිකුත් කිරීමත් සමඟ ක්‍රියාත්මක දිනය ආරම්භ වේ. කොන්ත්‍රාත්කරුට නිකුත් කරන ණයවර ලිපිය ක්‍රියාත්මක වන්නේ ආසියානු සංවර්ධන බැංකුව එකඟතා ලිපිය සැපයීමත් සමඟ පමණි. ආසියානු සංවර්ධන බැංකුව 2021 පෙබරවාරි 09 සහ 2021 පෙබරවාරි | ව්‍යාපෘති කටයුතු වේගවත් කිරීම සඳහා කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතු අතර ව්‍යාපෘති කාලය තුළ ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා කොන්ත්‍රාත්කරුගේ කටයුතු සමීපව අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. |

| | | |
|---|---|---|
| සඳහා මාස **05** ක් පමණක් ඉතිරිව තිබුණද අවශ්‍ය යන්ත්‍රෝපකරණ ආනයන කටයුතු විගණිත දිනය වනවිටත් අවසන්ව නොතිබුණි. | **10** දිනයන්හි එකඟතා ලිපි සපයා ඇත. එම නිසා ක්‍රියාත්මක දිනය **2021** පෙබරවාරි **10** විය යුතු අතර ණයවර ලිපිය විවෘත කිරීම කළ හැකි වන්නේ එම දිනෙන් පසුව පමණි. සමහර උපකරණ සැපයීමේ ප්‍රමාදයන් සටහන්ව ඇති අතර ඒ සඳහා කොන්ත්‍රාත්කරුගේ පැහැදිලි කිරීම් කැඳවා ඇත. | |

**2.2** කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| (අ) පුනර්ජනනීය බලශක්ති ක්ෂුද්‍ර බෙදාහැරීමේ නියමු ව්‍යාපෘතිය සැලසුම් කිරීම, ඉදිකිරිම, ස්ථාපනය කිරීම සහ ආරම්භ කිරීම සඳහා තෝරාගත් ලංසුකරු ක්ෂුද්‍ර බෙදාහැරීමේ පද්ධතියේ වසර දෙකක ක්‍රියාකාරීත්වය සඳහා අනිවාර්ය අමතර කොටස් සඳහා මිල ගණන් සඳහන් කර නොමැත. කෙසේ වෙතත්, තාක්ෂණික ඇගයීම් කමිටුව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට පෙර ඉහත ලංසු අයිතමයට අදාළ එකඟතාවයකින් යුත් විසඳුමකට යටත්ව ලංසුව නිර්දේශ කරන ලදී. පසුව, **2020** පෙබරවාරි **11** වන දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇත්තේ කොන්ත්‍රාත්කරු විසින් මිල ගණන් දක්වා ඇති අනෙකුත් අනිවාර්ය අමතර කොටස් සඳහා වසර දෙකක් හෝ ඊට වැඩි වගකීමක් ලබා දී ඇති බැවිනි. | කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට පෙර කොන්ත්‍රාත්කරු සමඟ පැවති රැස්වීමකදී මේ පිළිබඳව සාකච්ඡා කෙරුණි. ඔවුන් අදාල උපකරණ සඳහා වසර දෙකක හෝ ඊට වැඩි වගකීම් සහතිකයක් ලබා දී ඇති බැවින්, වසර දෙකක අමතර කොටස් සඳහා වන පිරිවැය ද පිරිනැමීම සමඟ ඇතුළත් වන බව සැලකේ. | ක්ෂුද්‍ර බෙදාහැරීමේ පද්ධතියේ වසර දෙකක ක්‍රියාකාරීත්වය සඳහා අනිවාර්ය අමතර කොටස් සැපයීමට ලංසුකරු බැඳී සිටින බැවින් සැපයුම්කරු එකඟ වූ කාල සීමාවන් සඳහා වගකීමක් සමඟ මෙම කරුණ සලකා බැලිය යුතුය. |